මාකදුරේ මධුෂ්ගේ මරණය සම්බන්ධයෙන් අද දින (ඔක්තෝබර් 21) පුවත්පත් තුළ පළව තිබූ පුවත් වාර්තාවන් නිරීක්ෂණය කිරීමේදී පෙනී ගිය කරුණක් වූයේ, එම ලේ වැකුණු මෘත දේහයේ ඡායාරූප සිංහල භාෂා පුවත්පත් තුළ පළව තිබූ ආකාරයයි.

අරුණ සහ මව්බිම පුවත්පත් තුළ මෙම ඡායාරූප කිසිදු ආකාරයක සැඟවීමකින් තොරව පළ කර තිබුණි. දිවයින පුවත හා දැක්වුණු ඡායාරූපයේ මුහුණ පමණක් බොඳ කර තිබුණු අතර, දිනමිණ පුවත හා දැක්වුණු ඡායාරූපයට රතු වර්ණ ලේයරයක් එක් කොට, එහි ලේ වැකි ස්වභාවය අඩු කිරීමට පියවර ගෙන තිබිණි.

ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් ඉදිරිපත් කළ වෘත්තිය ප්‍රතිපත්ති මාලාව ඔස්සේ දැක්වේ. මෙහිදී මාධ්‍ය මගින් සැලකිල්ලට ගත යුත්තේ, ඇතැම් පුද්ගලයින් හට මෙවැනි සංවේදී ඡායාරූප නැරඹීමට අසීරු වීමයි. එසේම මෙවන් මරණයකට ලක්වූවෙකුගේ ඡායාරූපයක් පළ කිරීම කෙතරම් සදාචාර සම්පන්න වන්නේද යන්නද විමසිය යුතු වේ.

ඒන් අනුව ගත් විට, මෙම මෘතදේහයේ ලේ වැකි ඡායාරූප පුවත්පතක පළ කිරීම කෙතරම් ආචාර ධාර්මික වන්නේද? ඒ පිළිබඳව ඔබේ අදහස් මොනවාද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Divaina #Dinamina #Mawbima**